# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1718/29 – 2011 අගෝස්තු 12 වැනි සිකුරාදා – 2011.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරළුගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො/එච්එන්ඩබ්/05/162 හා 2007.11.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.1764ක් පමණ වූ සාලාව වත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

උතුරට: පුස්සැල්ලාව වතුයාය හිමිකම් කියන සාලාව වතුයාය රණවිරු සෙවන අධිකාරිය සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: යුධ හමුදාව සතු ඉඩමට අයත් සාලාව කඳවුර සහ ඇළ; බටහිරට: පුස්සැල්ලාව වතුයාය හිමිකම් කියන සාලාව වත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2004/ඩී/50.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/2/ඉඅත්/163.
2010 සැප්තැම්බර් 15 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 696

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරලයේ සුළු කොට්ඨාසයේ වැදිගුණේ (අ.ග.පි. 170) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/බීඩීඑල්/2007/504 හා 2007.12.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 1.4348ක් පමණ වන ග්ලේන්ඇල්පින් වත්ත (ක්ෂෙත්‍ර අංක 11) නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ'**

උතුරට: ග්ලේන්ඇල්පින් වත්ත (ක්ෂෙත්‍ර අංක 11) සහ මාර්ග (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ග (ප්‍රාදේශීය සභා); දකුණට සහ බටහිරට: ග්ලේන්ඇල්පින් වත්ත (ක්ෂෙත්‍ර අංක 11).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2007/ඩී/220.
2009 ජනවාරි 24 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 697

1A – G 014921 – 365 (2011/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.